අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம்
State Ministry of Dhamma Schools, Parivenas & Bhikku Education

ඉසුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව / இசுருபாய, பத்தரமுல்ல, இலங்கை / Isurupaya, Battaramulla, Sri Lanka
☎ 011 278 5141 | 011 278 5617 | info.dpb@moe.gov.lk | www.dpb.moe.gov.lk

ගරු රාජ්‍ය අමාත්‍යතුමා / Hon. State Minister / கௌரவ இராஜாங்க அமைச்சர்
011 278 4836
011 278 4185
minister.dpb.@moe.gov.lk

ලේකම් / Secretary / செயலாளர்
011 278 6418
011 278 5617
secretary.dpb@moe.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number: ED/ST/BUD/7/5/1/1 | ඔබේ අංකය / உமது இல. / Your Number: | දිනය / திகதி / Date: 2021.12.19 |

පළාත් භාර සියලු ම නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන් සහ
කොට්ඨාස භාර සියලු ම සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන් හිමිවරුන් වෙත.

**<u>දහම් පාසල්, පිරිවෙන් සහ භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ සහයෝගයෙන් කොළඹ ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය සංවිධානය කරන බුදුදහම සහ බෞද්ධ උරුමය පිළිබඳ අන්තර්ජාතික ප්‍රශ්නෝත්තර වැඩසටහන</u>**

උක්ත කාරණය සම්බන්ධයෙන් 2021.12.16 වෙනි දින ඔබ වහන්සේ වෙත ලබා දෙන ලද වාචික උපදෙස්වලට වැඩිමනත් වශයෙනි.

02. දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ සහයෝගයෙන් කොළඹ ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය සංවිධානය කරන බුදු දහම සහ බෞද්ධ උරුමය පිළිබඳ අන්තර්ජාතික ප්‍රශ්නෝත්තර වැඩසටහන මීට පෙර ඔබ වහන්සේ වෙත දැනුම් දී ඇති පරිදි පහත සඳහන් ආකාරයට සංවිධානය කළ යුතු ය.

- තරගකරුගේ සුදුසුකම් - වයස අවුරුදු 14 – 22 අතර මූලික පිරිවෙන් 3, 4 සහ 5 යන ශ්‍රේණියක ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය.
- ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය මගින් ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු පත්‍රය සකස් කොට ලබා දෙනු ඇත.
- සීමිත දින ගණනක් තුළ ප්‍රශ්නපත්‍ර මුද්‍රණය කොට දිවයින පුරා පිරිවෙන්වලට බෙදාහැරීමේ අපහසුතාවක් පවතින බැවින් රහස්‍යභාවය සුරකෙන අයුරින් 2021.12.21 වෙනි දින පරිවේණාධිපති හිමිගේ පෞද්ගලික WhatsApp ගිණුමට ප්‍රශ්න පත්‍රය ලබා දී පිරිවෙනට අවශ්‍ය ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව පිරිවෙන මට්ටමින් සකස් කර ගත යුතු බවට උපදෙස් ලබා දිය යුතු ය.
- එම ප්‍රශ්න පත්‍රයට අදාළ පිළිතුරු පත්‍රය 2021.12.22 වෙනි දින ප.ව. 2.00 ට තරගය ආරම්භ කළ පසු ඔබ වහන්සේ වෙත ලබා දීමට කටයුතු කෙරෙන අතර ඒ සැණින් පරිවේණාධිපති හිමිගේ පෞද්ගලික WhatsApp ගිණුමට මුදා හැරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතු ය.
- පිරිවෙන මට්ටමින් ඇගයුමට ලක් කොට වැඩිම ලකුණු ලබා ගත් ජයග්‍රාහකයා 2021.12.27 වෙනි දින ප.ව. 2.00 ට පිරිවෙන අයත් කොට්ඨාසයේ මධ්‍යස්ථානයක පැවැත්වෙන පළාත් තරගයට ඉදිරිපත් කරවිය යුතු ය. (යම් හෙයකින් පිරිවෙනේ ඉහළ ම ලකුණු ලබා ගත් තරගකරුවන් කිහිපදෙනෙකු සිටී නම් එම තරගකරුවන් අතර වාචික හෝ ලිඛිත පරීක්ෂණයක් පිරිවෙන මට්ටමින් පවත්වා වඩාත් සුදුසු එක් ජයග්‍රාහකයෙකු පමණක් පළාත් මට්ටමේ තරගයට සහභාගී කරවිය යුතු බවට උපදෙස් ලබා දිය යුතු ය.)
- මීට පෙර ලබා දී ඇති උපදෙස් අනුව පළාත් මට්ටමින් පැවැත්වෙන තරගයට අවශ්‍ය ප්‍රශ්න පත්‍ර ප්‍රමාණය පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත මුද්‍රණය කරවා ගත යුතු ය.
- පළාතේ එක් මධ්‍යස්ථානයකට තරගකරුවන් කැඳවීමේ අපහසුතාවක් පවතින නිසා පිරිවෙන් කොට්ඨාස අනුව තෝරාගත් වඩාත් පහසු ස්ථානයක තරග පවත්වා ඇගයුම් කොට එහි ලකුණු පළාත් මට්ටමින් ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා පළාත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) වෙත ලබා දීමට කටයුතු කළ යුතු ය.

- පළාත් මට්ටමින් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් ජයග්‍රාහකයින් 2021.12.29 වෙනි දින පෙ.ව. 10.00 ට අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වෙන තරගයට ඉදිරිපත් කළ යුතු ය. (යම්හෙයකින් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථානවල එක ම ලකුණු ලබා ගත් තරගකරුවන් කිහිපදෙනෙකු සිටී නම් වඩාත් සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර ජයග්‍රාහකයින් තිදෙනෙක් පමණක් සමස්ත ලංකා තරගයට සහභාගී කරවීමට කටයුතු කළ යුතු ය.)

- පහත සඳහන් පරිදි තරග වට තුනක් පැවැත්වේ

  - පළමු වටය - 2021.12.22 බදාදා දින ප.ව. 2.00 ට පිරිවෙන මට්ටමින්
  - දෙවන වටය - 2021.12.27 සඳුදා දින ප.ව. 2.00 ට පළාත් මට්ටමින්
  - තුන්වන වටය - 2021.12.29 වෙනි බදාදා පෙ.ව. 10.00 ට අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේ දී

03. ඉන්දියාවේ සංචාරක අමාත්‍යාංශය හා සංස්කෘතික සබඳතා පිළිබඳ ඉන්දියානු කවුන්සිලය සමග ඒකාබද්ධ ව ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් අප අමාත්‍යාංශය වෙත 2021.12.15 වෙනි දින පැමිණ සිදු කළ සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

04. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සංස්කෘතික සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින් පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ඉලක්ක කොට බුදු දහම හා බෞද්ධ උරුමය පිළිබඳ අන්තර්ජාතික ප්‍රශ්නෝත්තර වැඩසටහනක් ලෙසින් සිදු කෙරෙන මෙම ව්‍යාපෘතිය 2021.12.31 දිනට පෙර අවසන් විය යුතු බව ඔවුන්ගේ අදහස වී තිබේ.

05. මෙම අන්තර්ජාතික ප්‍රශ්නෝත්තර වැඩසටහන අවසන්වීමෙන් පසු පිරිවෙන මට්ටමින් ප්‍රථම ස්ථානය ලබා ගන්නා තරගකරුට ජාත්‍යන්තර මට්ටමේ සහතිකයක් ද, පළාත් මට්ටමින් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගන්නා තරගකරුවන්ට ජාත්‍යන්තර මට්ටමේ සහතිකයක් සමග වටිනා ත්‍යාගයක් ද, සමස්ත ලංකා මට්ටමින් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගන්නා තරගකරුවන්ට දින පහක ඉන්දීය සංචාරයක් ද පිරිනැමීමට ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය සංවිධානය කර ඇත.

06. ඊට අමතර ව පිරිවෙන්වල ඉගෙනුම් සම්පත් වැඩිදියුණු කිරීම සහ මානව සම්පත් ධාරිතා සංවර්ධනය සඳහා 2022-2026 කාලය තුළ වාර්ෂික ව මූල්‍ය ආධාර පිරිනැමීම සඳහා ද ඉන්දියානු රජය විසින් අවශ්‍ය පියවර ගෙන ඇත.

07. මේ කරුණු සියල්ල සැලකිල්ලට ගෙන මුලින් ලබා දී ඇති උපදෙස් අනුව උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් ද, 2021.12.17 දින මූලික හා මහ පිරිවෙන්වලට නිවාඩු ලබා දී ඇති පරිසරයක වුව ද මෙම වැඩසටහන ඉතා සුළු කාලයක් තුළ සංවිධානය කරන ලද්දේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට හා පිරිවෙන් අධ්‍යාපන පද්ධතියට හිමිවෙන ප්‍රතිලාභ වැඩිදියුණු කර ගැනීමේ අරමුණ නිසා බව කෘත්‍යාධිකාරී හා පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලාට සන්නිවේදනය කරන මෙන් ද කාරුණික ව දන්වා සිටිමි.

අත්/කළේ,

කන්තලේ විජිතවංස හිමි
අධ්‍යක්ෂ (සංවර්ධන)

පූජ්‍ය කන්තලේ විජිතවංස හිමි
අධ්‍යක්ෂ (සංවර්ධන)
දහම් පාසල්, පිරිවෙන් හා
භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
ඉසුරුපාය - බත්තරමුල්ල

එස්.එච්.හරිස්චන්ද්‍ර
ලේකම්,
දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු
අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

පිටපත් :

1. පිරිවෙන් අධ්‍යාපන උපදේශක ස්වාමීන් වහන්සේ
2. අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) ස්වාමීන් වහන්සේ
3. අතිරේක ලේකම් (සංවර්ධන), දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
4. පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ සියලු ම අංශ ප්‍රධාන නි.අ.අ. ස්වාමීන් වහන්සේලා
5. ගොනුවට

} කාරු. දැ.ගැ.පි. / අ.ක.ස